සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිමත් කිරීමට ආණ්ඩුව කැපවෙනවා

සංචාරකයින්ගේ සංචරණ ධාරිතාව පුළුල් කිරීම සඳහා නව සංචාරක ගමනාන්ත සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම රජයේ ප්‍රමුඛ කාර්යයක් වනු ඇත.

ඊට සමගාමීව, අධික තදබදය පිළිබඳ ගැටලු විසඳීමට සහ ක්ෂේත්‍රයේ ධාරිතාව වැඩිදියුණු කිරීමට ඩිජිටල් ටිකට්පත් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

ජපන් ආයෝජනවල සහාය ඇතිව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දෙවන පර්යන්තය පුළුල් කරනු ලැබේ.

සංචාරක ආකර්ෂණීයත්වයක් ඇති ස්ථාන පිළිබඳ තොරතුරු සැපයීම, ආරක්ෂක අනතුරු ඇඟවීම් ලබා ගැනීම, සංචාරක අත්දැකීම් පිළිබඳ ප්‍රතිචාර සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ලැබෙන පැමිණිලි අධීක්ෂණය කිරීම සඳහා සංචාරක පොලිසිය, රාජ්‍ය ආයතන සහ සිවිල් සංවිධාන සම්බන්ධ කරන තාක්ෂණ පාදක විසඳුම් සංයෝජනයක් හරහා සංචාරක ආරක්ෂාව සහ පහසුකම් සැපයීම රජය විසින් සිදු කරනු ඇත.

6. ආර්ථික සංවර්ධනයේ කොඳු නාරටිය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම රජයේ ප්‍රධාන අරමුණක් වේ. මූල්‍ය සඳහා ප්‍රවේශය දිගු කලක් තිස්සේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ග්‍රාමීය ව්‍යවසායකයින් මුහුණ දෙන විශාලතම අභියෝගයන්ගෙන් එකකි. මේ රටේ මූල්‍ය සංස්කෘතිය ඇපකර මත පදනම් වූ ණය දීම වන අතර එමඟින් විශාල කොටසකට මූල්‍ය සඳහා වන ප්‍රවේශය ඇහිරී තිබෙනවා. බැංකු තම තැන්පත්කරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කළ යුතු අතර ඔවුන්ගේ ණය දීමේ පිළිවෙත්වල තාර්කික බව සහතික කළ යුතු අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ නව ව්‍යවසායකයින් සඳහා ද විසඳුමක් තිබිය යුතුයි.

මේ සඳහා රජය සංවර්ධන බැංකුවක් පිහිටුවීමට කටයුතු කරමින් සිටිනවා. පළමු පියවර ලෙස, නව පරිපාලන ව්‍යුහයක් හරහා සංවර්ධන බැංකුවක ක්‍රියාකාරිත්වය දැනට පවතින රාජ්‍ය බැංකු යන්ත්‍රණය හරහා ස්ථාපිත කරනවා. ජාතික ණය ඇපකර ආයතනය (NCGI) හරහා ලබා ගත හැකි ණය ඇපකර පහසුකම් තුළින් රජය මෙම කාර්යයට සහාය වනවා.

7. නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම

පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය සහ ජාතික බුද්ධිමය දේපළ සංවිධානය (NIPO) ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් සහ උපදේශනයෙන්, පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති කර්මාන්ත අවශ්‍යතා සමඟ පෙළගස්වනු ලබනවා. පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා පර්යේෂණ සහ සංවර්ධන මූලපිරීම් ප්‍රමුඛතාවය වනු ඇත;

- **තෝරාගත් පර්යේෂණ සහ සංවර්ධන මූලපිරීම් සඳහා සම-මූල්‍යකරණය සැපයීම.**
- **ගෝලීය වශයෙන් සමාන ක්ෂේත්‍රවල නියැළී සිටින ශ්‍රී ලාංකිකයන් සමඟ රාජ්‍ය පර්යේෂණ සහ සංවර්ධන ආයතන සහ අදාළ විශ්වවිද්‍යාල අතර සම්බන්ධතා සම්බන්ධීකරණය කිරීම.**
- **මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය වෙත ඇතුළු වීම හරහා අපනයනකරුවන්ට ගෝලීය වශයෙන් වෙළෙඳ නාම ආරක්ෂාව ලබා ගැනීමට පහසුකම් සැලසීම.**

2020 වසරේ දී පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම් 272ක් සිදු වූ බවත් ඉන් පේටන්ට් බලපත්‍ර 223ක් අනේවාසික ලියාපදිංචි කිරීම් බවත් 2019 වසරේ දී පේටන්ට් බලපත්‍ර අයදුම්පත් ඉදිරිපත් කිරීම අනුව 61 වන රට ලෙස ශ්‍රේණිගත වී ඇති බවත් වාර්තා වේ. වාණිජකරණය තුළින් ආර්ථිකයේ යහපත සඳහා යොදා නොගත් සහ ආයෝජන අවස්ථා නෙළා නොගත් පර්යේෂණ සොයාගැනීම් ගණනාවක් ඇති බව අප නිරීක්ෂණය කරනවා. එබැවින්, පර්යේෂණ ආයතන මෙහෙයවීම සහ වාණිජකරණයට විභවයන් සහිත පර්යේෂණ, ප්‍රධාන ධාරාවට ගෙන ඒම සඳහා ශක්තිමත් ප්‍රමුඛ මධ්‍යගත ආයතනික යන්ත්‍රණයක් අවශ්‍ය වනවා. මේ සඳහා, පර්යේෂණ සොයාගැනීම් වාණිජකරණය කිරීමට නවෝත්පාදන නව නිපැයුම් අරමුදලක් නිර්මාණය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

8. රාජ්‍ය වියදම් කළමනාකරණය

රාජ්‍ය වියදම් විධිමත් කිරීමට රජය අඛණ්ඩව උත්සාහ දරනවා. මහජන නියෝජිතයින්ට ලබා දෙන දීමනා සහ ප්‍රතිලාභ පිළිබඳ සමස්ත පද්ධතිය සමාලෝචනය කරනවා.

වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් දේශපාලන නායකත්වය පැත්තෙන් ආදර්ශයක් දීම සඳහා ඇමැති මණ්ඩලය අමාත්‍යවරුන් 21 දෙනෙකුට සීමා කළා. රාජ්‍ය වියදම් අඩු කරමින් අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ වියදම් තාර්කීකරණය කර තිබෙනවා.

ජනාධිපතිවරයා, අගමැතිවරිය, මැති ඇමැතිවරු වෙනුවෙන් වෙන් කරන ලද මන්දිර වැනි පොදු සම්පත් ඵලදායී ලෙස මහජන භාවිතයට යොමු කර තිබෙනවා. එවැනි දේපළ ආර්ථික වශයෙන් ශක්‍යතාවක් ඇති ව්‍යාපෘති සඳහා සහ මහජන අවශ්‍යතා සඳහා උපරිම ලෙස භාවිත වේ. නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරනු ලබනවා.

අධික ධාවන සහ නඩත්තු වියදම් දැරීමට සිදු වන සියලුම සුඛෝපභෝගී වාහන වෙන්දේසි කරනු ලබනවා.

- **වාහන සඳහා රජයේ වියදම් අවම කිරීම**

රජයේ නිලධාරීන්ට නිල වාහන ලෙස පවරන ලද වාහන ඉහළ ඉන්ධන පරිභෝජනයක් ඇති සැලකිය යුතු වටිනාකමකින් යුක්ත වාහන වනවා. මෙම වාහන සඳහා අධික නඩත්තු පිරිවැයක් දැරීමට වෙනවා. එබැවින් තෝරාගත් නිලධාරීන්ට සුදුසු මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හරහා වාහන සඳහා වන අධික වියදම් අවම කිරීමට රජය තීරණය කර තිබෙනවා.

- **රාජ්‍ය ආයතන විධිමත් හා කාර්යක්ෂම කිරීම**

වසර ගණනාවක් පුරා ශ්‍රී ලාංකේය රාජ්‍ය යන්ත්‍රණය, පහසුවෙන් පාලනය කළ නොහැකි ව්‍යුහයක් දක්වා ක්‍රමයෙන් විශාල වී තිබෙනවා. සුදුසු අධ්‍යයනයකින් හෝ පදනමකින් තොරව රජයේ ආයතන ගණනාවක් ස්ථාපිත කර තිබෙනවා. රාජ්‍ය සම්පත් නාස්තියක් මෙන්ම, එමඟින් රාජ්‍ය සේවාවන් ඵලදායී ලෙස සැපයීමට ද විශාල ලෙස බාධාවන් ඇති වී තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස එකම කාර්යය දෙවාරයක් සිදු කිරීම, නාස්තිය සහ රාජ්‍ය සේවාවන් ඵලදායී ලෙස සැපයීමට බාධා වීම සිදුව තිබෙනවා. මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා රාජ්‍ය ආයතන රැසක කාර්යයන් සහ ඒවායෙහි ඵලදායීතාව සමාලෝචනය කිරීමට කමිටුවක් අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් යුක්තව දැනටමත් පිහිටුවා තිබෙනවා. එහිදී කුමන ආයතන අඛණ්ඩව පවත්වාගෙන යා යුතුද, වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කළ යුතුද, වසා දැමිය යුතුද, අරමුණ වෙනස් කළ යුතු ආයතන තිබේද, ආයතනයේ අරමුණට අනුකූල වන ලෙස ප්‍රතිසංවිධානය කළ යුතු ආයතන මොනවාද ආදිය ඒ අනුව යළි තීරණය කරන්නට පුළුවන්. මෙමඟින්, රාජ්‍ය සේවාවන් සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හරහා රාජ්‍ය මුදල් නාස්තිය වළක්වාගැනීම සම්බන්ධයෙන් ද සැලකිය යුතු ප්‍රතිලාභ අත්කර ගැනීමට අප අපේක්ෂා කරනවා.

- **රජය සතු ව්‍යවසායන්හි ආයතනික පාලනය**

රජය සතු ව්‍යවසායන් හේතුවෙන් පැන නඟින අනාගත මූල්‍ය අවදානම අවම කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා මූලික අවශ්‍යතාවක් වන්නේ රජය සතු ව්‍යවසායන්හි ආයතනික පාලනය වැඩිදියුණු කිරීමයි. මේ සඳහා, පාලනය, මූල්‍ය විනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, තෝරාගත් රාජ්‍ය ව්‍යවසායන් පරිපාලිතයන් (subsidiaries) ලෙස පවත්වා ගනු ලබන රාජ්‍ය හිමිකාරිත්වය හා පාලනය ඇති පරිපාලක සමාගමක් (Holding Company) පිහිටුවනු ලැබේ.

9. කාන්තා ආර්ථික සහභාගිත්වයට සහාය වීම

කාන්තා කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය මෙන්ම පළාත් සභා මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක වේ. ඒ තුළ විශේෂයෙන් ගැබිනි මාතාවන් සඳහා පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මාසික ආධාරයක් ලබා දෙන අතර, ඒ සඳහා රුපියල් මිලියන 7,500ක් වෙන් කර ඇත. එසේම මවුවරුන් හා දරුවන්ගේ පෝෂණය සඳහා ත්‍රිපෝෂ වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා.

ළමා හා කාන්තා හිංසනය වැළැක්වීම, කාන්තා සවිබල ගැන්වීම සහ කාන්තාවන් සුරැකීම යන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 120ක් ද වෙන් කර තිබෙනවා. කාන්තාවන් ඉලක්ක කර ගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දිවයින පුරා ව්‍යාප්තව ඇති කාර්යාල ජාලය පවත්වා ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 720ක වියදමක් දරනු ලැබේ.

10. නීරෝගි සමාජයක් කරා

i. **සෞඛ්‍ය පද්ධතිය ඩිජිටල්කරණය**

කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය තුළ ඩිජිටල්කරණය අවම මට්ටමකයි තිබෙන්නේ. ඒ අනුව, 2025 වසරේ සිට සෞඛ්‍ය සේවා සැපයීම ඩිජිටල්කරණය වීම වැඩි දියුණු කිරීම සඳහා නව මූලපිරීම් හා මැදිහත්වීම් සිදු කරනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) කාර්යයන් ඩිජිටල්කරණය කිරීම සහ "සුවස්ථා" පද්ධතිය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම මෙයට ඇතුළත් වෙනවා.

ii. **ග්‍රාමීය මට්ටමේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම**

බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක (PMCUs) 1,000කට අධික ප්‍රමාණයක සහ ප්‍රාදේශීය රෝහල්වල සේවා සැපයීම වැඩිදියුණු කිරීමට පියවර ගනු ලබනවා. තවද, විශේෂයෙන් වයස්ගත ජනගහනය ඉලක්ක කර ගනිමින් සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකවලින් සහන සහ වයෝවෘද්ධ සත්කාර සේවා පවත්වනවා. පවතින මානව සම්පත් ප්‍රතිසංවිධානය කිරීම හරහා අවශ්‍ය මානව සම්පත් ලබා දීමට කටයුතු කරනවා.

ත්‍රීමලේ තෙල් ටැංකි 61ක් ජාත්‍යන්තර ආයතන සමඟ සංවර්ධනය කරනවා

පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් නවීකරණයට වැඩි නැඹුරුවක් දක්වනවා

iii. **වතු ආශ්‍රිත සෞඛ්‍ය තත්ත්වය**

ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන්ට (PPP) එළඹීම හරහා වතු ආශ්‍රිත සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගන්නවා. වතුවල ඇති රෝහල්වලට අවශ්‍ය මානව සම්පත්, අවශ්‍ය උපකරණ සහ ඖෂධ රජයෙන් ලබා දෙනවා.

iv. **වසංගත සූදානම**

ඉදිරි වසර තුන තුළ සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව වසංගත වැළැක්වීම, සූදානම සහ වසංගත සඳහා සුදුසු පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ඇති ජාතික ධාරිතාව වැඩිදියුණු කරනවා. මීට අමතරව, ඉදිරියේ දී ඇති විය හැකි සෞඛ්‍ය උවදුරු කල් ඇතිව සූක්ෂ්මව නිරීක්ෂණය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ හැකියාව ශක්තිමත් කරනවා.

සෞඛ්‍යසම්පන්න ජනගහනයක් මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා තීරණාත්මක වන අතර, එය ඵලදායිතාව ඉහළ නැංවීමට, අධ්‍යාපනික ප්‍රතිඵල වර්ධනයට, ශ්‍රම බළකායේ සහභාගීත්වය ඉහළ නැංවීමට, නවෝත්පාදන සහ කුසලතා සංවර්ධනය සඳහා සෘජුවම දායක වෙනවා. එය සමාජ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරනවා. ඒ අනුව, 2025 වසර සඳහා රජයේ සෞඛ්‍ය අය - වැය ප්‍රතිපාදනය රුපියල් මිලියන 604,000 දක්වා සැලකිය යුතු ලෙස වැඩි කර තිබෙනවා.

ඖෂධ සැපයුම සහ වෛද්‍ය සැපයුම සහතික කිරීම සඳහා 2025 අය - වැයෙන් රුපියල් මිලියන 185,000ක් වෙන් කර තිබෙනවා. ගුණාත්මක ඖෂධ සහ වෛද්‍ය සැපයුම් කිසිදු බාධාවකින් තොරව ප්‍රසම්පාදනය හා බෙදා හැරීම සහතික කිරීමටත්, ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ප්‍රශස්ත කරන අතරම නාස්තිය අවම කිරීමටත්, අරමුදල් සම්පූර්ණයෙන් භාවිත කිරීමටත් රජය සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබනවා.

v. **ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා සෞඛ්‍ය ප්‍රතිකාර ලබාදීම**

ශ්‍රී ලංකාව තුළ පසුගිය දශකය තුළ ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් තිබෙනවා.

මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා අවශ්‍ය සෞඛ්‍ය, අධ්‍යාපන සහ අනෙකුත් සේවා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වසර 5ක ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජිතයි. මූලික පියවරක් ලෙස, ස්නායු සංවර්ධන ආබාධ සහිත ළමුන් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහිත ප්‍රතිකාර මධ්‍යස්ථානයක් රජේවේ ආර්යා ළමා රෝහලෙහි පිහිටුවීම සඳහා 2025 වසර සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. තවද, ඉදිරි වසර පහ තුළ අවශ්‍ය මානව සම්පත් සහිතව සෑම දිස්ත්‍රික්කයකම මෙවැනි ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂා කරනවා.

vi. ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා සියල්ල අන්තර්ගත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්

ඔටිසම් තත්ත්වයේ පසුවන ළමුන් සඳහා පෙර පාසල් සහ දිවා සුරැකුම් පහසුකම් සීමිතයි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත ළමුන් සඳහා ලබාදිය යුතු සියල්ල අන්තර්ගත අධ්‍යාපනය සහ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් සහ භාරකරුවන්ට ඊට අවශ්‍ය හැකියාව හා අවබෝධය නොමැතිකමයි. ඒ අනුව, ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

රෝග පාලනය සහ වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක 1,000කට අධික ප්‍රමාණයක සහ ප්‍රාදේශීය රෝහල්වල සේවා සැපයීම වැඩිදියුණු කිරීමට පියවර ගනු ලබනවා.

11. සැමට අධ්‍යාපන අවස්ථාවන්

රට තුළ පැවති ආර්ථික අභියෝගයන් හේතුවෙන් 2019 සිට පාසල් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමක් සිදු වුණේ නැහැ. එබැවින් පාසල් යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා 2025 අය - වැය තුළින් රුපියල් මිලියන 10,000කට වඩා දැනටමත් වෙන් කොට තිබෙනවා.

එමෙන්ම විශ්වවිද්‍යාල පද්ධතිය තුල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 135,000ක් මේ වන විටත් වෙන්කර තිබෙනවා.

- **පෙර පාසල් ළමුන්ගේ පෝෂණය**

පෙර පාසල් උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන යටතේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා 2025 අය - වැය ඇස්තමේන්තු තුළින් රුපියල් මිලියන 1,000ක් දැනටමත් වෙන්කර තිබෙනවා. තෝරාගත් මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 80ක් වෙන් කර තිබෙනවා.

තවද, පෙර පාසල් ගුරුවරුන් මානව සම්පත් සංවර්ධනයේ ප්‍රධාන පාර්ශ්වයක් ලෙස හඳුනා ගනිමින්, පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ සේවය ඇගයීම සඳහා ඔවුන්ට දැනට ලබාදෙන දීමනාව මේ වසරේ ජූනි මාසයේ සිට තවත් රුපියල් 1,000කින් වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **පාසල් අධ්‍යාපනය නව්‍යකරණය කිරීම**

පදිංචි ස්ථානයේ සිට කිලෝමීටර් 3ක අරයකින් යුත් ප්‍රදේශය තුළ ප්‍රාථමික පාසලක් සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වෙනවා. මේ වන විට, දීපව්‍යාප්තව රජයේ පාසල් 10,126ක් තිබෙනවා. ඉන් 3,946ක් පමණ ප්‍රාථමික පාසල් වන අතර මෙම පාසල්වලට දළ වශයෙන් ළමුන් 634,094ක් ඇතුළත් වී තිබෙනවා. මේවායින් 100ට අඩු සිසුන් සිටින පාසල් 3,000කට වැඩි ප්‍රමාණයක් ඇති අතර ඉන් පාසල් 1,471ක සිටින්නේ සිසුන් 50ට අඩු සංඛ්‍යාවකි. මෙම පාසල් බොහොමයක් ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇත. මෙමඟින් පාසල් අතර විශාල විෂමතාවක් ඇති වී තිබෙනවා. මෙම විෂමතාවය නිසා බහුතර සිසුන් සංඛ්‍යාවකට අසාධාරණයක් සිදු වෙනවා. මේ නිසා, පවතින පාසල් පද්ධතිය සමාලෝචනය කොට, යළි ස්ථානගත කිරීමට අවශ්‍ය ජාතික සැලැස්ම සකස් කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **ශිෂ්‍යාධාර**

i. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ සුදුසුකම්ලත් අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ගේ ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500 දක්වා වැඩි කරනවා. මේ සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

ii. ක්‍රීඩා පාසල්වල සිසුන්ට ලබාදෙන මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා 2025 අයවැයෙන් දැනටමත් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

iii. වෘත්තීය අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා මාසික දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා 2025 අයවැයෙන් දැනටමත් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, අමතරව තවත් රුපියල් මිලියන 200ක් වෙන් කරනවා.

iv. විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කිරීමටත්, ශිෂ්‍යාධාර දීමනා රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කිරීමටත් අප යෝජනා කරනවා. මේ සඳහා රුපියල් මිලියන 4,600ක මුදලක් 2025 අයවැයෙන් දැනටමත් වෙන් කර තිබෙනවා.

මේ සියලු දීමනා ගෙවීම් 2025 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වෙනවා.

- **උසස් ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය**

අ. පො. ස. උසස් පෙළ විභාගයෙහි කැපී පෙනෙන දක්ෂතා පෙන්වන සිසුන්ට ඉහළ පෙළේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්ව පිරිනැමීමටත්, ඔවුන් ලබාගත් දැනුම සහ කුසලතා රටෙහි සංවර්ධනයට යොදා ගැනීම සඳහා නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමටත් වැඩසටහනක් ඇති කරනවා. 2025 වසරේ දී මෙම වැඩසටහන ආරම්භ කිරීමට රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම**

පළාත් පහක විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට අප යෝජනා කරනවා. බස්නාහිර, උතුර, මධ්‍යම, ඌව සහ උතුරුමැද පළාත් මේ සඳහා තෝරා ගනු ලබනවා. එම පළාත්වල ක්‍රීඩා පාසල් සංවර්ධනයට රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **යාපනය සහ අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල වැඩිදියුණු කිරීම**

යාපනයේ සහ අවට දූපත්වල පාසල් සිසුන් ඇතුළු පාඨකයන් විශාල පිරිසක් යාපනය පුස්තකාලය භාවිත කරනවා. නමුත් මෙම පාඨකයන්ගේ ප්‍රයෝජනය සඳහා යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය කර නැහැ. එම නිසා මෙම පුස්තකාලයට පරිගණක ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් ලබාදීමට මෙවර අයවැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. ඊට අමතරව, අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනය සඳහා මෙම අයවැය යටතේ තවත් රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

12. බලශක්ති අංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති ක්ෂේත්‍රය ඉතා වැදගත් වෙනවා. බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා වැඩි නැඹුරුවක් දක්වනවා. ගාස්තු තීරණය කිරීමේ දී ලංකාවට උපරිම වාසියක් ලබා දිය හැකි දේශීය හා විදේශීය ආයෝජකයින් දිරිගන්වන අතරම බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට රජය අඛණ්ඩව කටයුතු කරනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගතකරණයට පහසුකම් සැලසීම සඳහා නියාමන රාමුවට අවශ්‍ය ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛත්වය දෙමින් සංශෝධිත විදුලිබල පනත ඉක්මනින් සම්මත කිරීමට අපේක්ෂා කරනවා.

සුළං බලයෙන් විදුලිය ජනනය කිරීමේ මෙගාවොට් 50ක ව්‍යාපෘතියකට අදාළව විදුලි ඒකකයක් සඳහා අමෙරිකානු ඩොලර් ශත 4.65ක මිලකට පසුගියදා ටෙන්ඩරයක් ප්‍රදානය කළා. එවැනි තත්ත්වයක් තිබියදී, අමෙරිකානු ඩොලර් ශත 8.26ක් වැනි අධික ගාස්තුවකට ව්‍යාපෘති ලබාදීම සාධාරණීකරණය කළ නොහැකියි. කර්මාන්ත, අපනයනකරුවන් සහ පාරිභෝගිකයින්ට තරගකාරී පිරිවැයකින් බලශක්තිය සැපයීම සඳහා අපි අවම ගාස්තුවක් මත පදනම් වූ බලශක්ති ආයෝජන සඳහා ඉඩප්‍රස්ථා ලබා දීමට කටයුතු කරනවා. ආයෝජන ගෙන එනු ලබන සමාගම හෝ රට මත රඳා පවතිමින් කටයුතු කිරීමට කිසිවිටකත් අප බලාපොරොත්තු වන්නේ නැහැ.

මෙට්‍රික් ටොන් 10,000 බැගින් ක්‍රියාකාරී ධාරිතාවකින් යුත් ටැංකි 99 කින් සමන්විත ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් සංස්ථාවට හා ඉන්දියානු ඔයිල් සමාගමට ලබා දී තිබෙන තෙල් ටැංකි හැර තවත් තෙල් ටැංකි 61 ක් තිබෙනවා. මෙම තෙල් ටැංකි පිහිටි ස්ථානය ද සලකන විට, ජාත්‍යන්තර ඉන්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාවක් පවතිනවා. ජාත්‍යන්තරව පිළිගත් ආයතන සමග ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස එය සංවර්ධනය කිරීමට අප අපේක්ෂා කරනවා.

9 පිටුවට

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board
ඉරිදා 2025.02.16
නිල ප්‍රතිඵල www.nlb.lk
මහජන සම්පත
දිනුම් වාරය: 5749
මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 28,596,936.00
ජයග්‍රාහී අක්ෂරය D ජයග්‍රාහී අංක 1 8 8 4 0 9
අදි සම්පත දිනුම් වාරය 324
D 8 4 0 9 ජයග්‍රාහී අක්ෂරය ජයග්‍රාහී අංක
ගෝවි සෙත
දිනුම් වාරය 3991 දිනය 2025.02.16 මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 80,116,771.04
ජයග්‍රාහී ඉංග්‍රීසි අක්ෂරය Q ජයග්‍රාහී අංක 03 08 58 78 විශේෂ අක්ෂරය Q
Mega POWER
දිනුම් වාරය 2097 දිනය 2025.02.16 මිළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 462,395,318.00
මිළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මිළඟ ලාභී සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
P 07 16 56 67 71
NLB ජය ජය JAYA
දිනය 2025.02.16 දිනුම් වාරය 017
ජයග්‍රාහී අක්ෂරය T ජයග්‍රාහී අංක 4 7 4 1
හදිසි
දිනය 2025.02.16 දිනුම් වාරය 1058 මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 3,608,197.28
ජයග්‍රාහී ලේඛනය මීන ජයග්‍රාහී අංක 05 06 40 61 ධනයෝග අංකය 76637 ඩබල් සෙට් අංකය 01
ධන නිධානය
දිනුම් වාර